විඤ්ඤාණය

සම්පාදක

වෛද්‍ය ලසිත මලලසේකර

ධර්ම දානය පිණිසයි

විඤ්ඤාණය

සම්පාදක: වෛද්‍ය ලසිත මලලසේකර

ප්‍රථම මුද්‍රණය - 2019

ධර්ම දානයක් වශයෙන් මෙම ග්‍රන්ථය මුද්‍රණය කර බෙදා හරින ලදී

මුද්‍රණය

SRIDEVI

ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
27, පැපිලියාන පාර, නැදිමාල,
දෙහිවල.
දූරකථන:0112716709

පෙරවදන

මෙම පොත් පිංචෙන් බලාපොරොත්තු වන්නේ විඤ්ඤාණය ඇතුළු අනෙක් පංච උපාදානස්කන්ධයේ අංග වන රූප, වේදනා, සංඥා සංඛාර වැනි ගැඹුරු පාලි වචනවල අර්ථ අපගේ එදිනෙදා ව්‍යවහාරය තුළින් තේරුම් ගැනීමට අවශ්‍ය පසුබිම සෑදීමය. එමගින් තමා තුළින්ම අනිත්‍ය, දුකඛ, අනාත්ම ස්වභාවයන් මතුකරගැනීමට හැකියාව ලැබෙනු ඇත. රාග, ද්වේෂ, මෝහයෙන් තොරව කුසල සිත නිරතුරුව පවත්වමින්, අප සැමගේ ඉලක්කයවන නිවන කරා යෑමට එය පිටිවහලක් වෙනවා නිසැකය.

මෙබඳු ග්‍රන්ථයක අවශ්‍යතාවය ලියන්නට තරම් ධර්මඥානයද ලබාදී, පාලි ත්‍රිපිටකයේ සඳහන් ධර්මය ප්‍රායෝගික ජීවිතයෙන්ම ඉස්මතු කරමින්, ඇහැටුවැව, පුරාණ වලගම්බා ආරණ්‍යයේ හුදෙකලාවූ ජීවිතයක් ගෙවන බෙල්ලන්විල ධම්මානන්ද හිමියන් නමස්කාර පූර්වකව සිහිපත් කරමි.

මෙම කෘතිය මැනවින් මුද්‍රණය කරදුන් දෙහිවල නැදිමාල ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් ආයතනයට තුති පුදමි.

මීට වසර තුනකට පෙර මිය පරලොව යන්නට යෙදුනු ලතා මලලසේකර මව්තුමියගේ පරලොව ජීවිතය යහපත්වීමට මේ සියලු පින් හේතු වාසනා වේවා!

ලසිත මලලසේකර
12, මාලමුල්ල බටහිර
පානදුර

ප්‍රණාමය

බෙල්ලන්විල ධම්මානන්ද හිමියන් ගැන හැඳින්වීමක් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

උසස් පෙළ ගණිත අංශයෙන් ඉහළින්ම සමත්ව මොරටුව විශ්වවිද්‍යාලයට ඇතුළුවූ උන්වහන්සේ 2004 වසරේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය ලැබීය. කුඩා කල සිටම පාලි ත්‍රිපිටකය කියවීමටත්, භාවනාවටත් යොමුවීමෙන් ලත් අත්දැකීම් නිසාදෝ, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු ලැබුණු උසස් රැකියාවටද සමුදී, කාම මඩගොහුරුව හැර උතුම් පැවිදි බිමට පත්විය. අති පූජ්‍ය නා උයනේ අරියධම්ම මාහිමිපාණන්ගේ ශිෂ්‍යයෙක් ලෙස තවත් ධර්මය ප්‍රගුණ කළ උන්වහන්සේ ආරණ්‍යවාසි හුදෙකලා ජීවිතය ප්‍රිය කරති.

පාලි ත්‍රිපිටකය මැනවින් හැදෑරූ උන්වහන්සේ අභිධර්ම පිටකය ගැන ඇති හසල දැනුමෙන් මෑතකාලීන අභිධර්මය ලෙස ඇති සාවද්‍ය විවරණ පෙන්වා දෙමින් "අභිධර්මය නොවන අභිධර්මය" යන ග්‍රන්ථය සම්පාදනය කර ඇත. කුසල සිහිපත් කිරීම් තුළින් නිරතුරුවම ධර්මය එදිනෙදා ජීවිතයට ගලපා ගැනීමේ ආකාරය විස්තර කරමින් "සතිය" නැමති ග්‍රන්ථයද එළිදක්වා ඇත. පෙළ දහමට අනුව ගුණදම් පුරමින් සිල්වත්ව, භාවනානුයෝගීව ගතකරන භික්ෂු ජීවිතයම ශාසන දියුණුව ලෙස සලකන උන්වහන්සේට තවදුරටත් ශාසනය ඒකාලෝක කරමින්, නිවන සාක්ෂාත් කරගැනීමට වාසනාව ලැබේවා!

-සම්පාදක-

පටුන

අතට ලැබුන වාසනාව	07
පාලි පදවල අර්ථ දැනගැනීම	07
විඤ්ඤාණය යන පදයේ අර්ථය	07
විඤ්ඤාණය සහ ජීවත්වීම	08
විඤ්ඤාණයේ ප්‍රභේද	09
ඉන්ද්‍රිය හය සහ විඤ්ඤාණය	10
මනෝවිඤ්ඤාණය ප්‍රායෝගිකව	11
විඤ්ඤාණය සහ වේදනාව	12
විඤ්ඤාණය සහ සංඥාව	12
විඤ්ඤාණය සහ සංඥාව අතර වෙනස	13
විඤ්ඤාණය සහ චේතනාව	14
විඤ්ඤාණය ඇතිවීමට හේතු	15
පටිච්චසමුප්පාදයට අනුව විඤ්ඤාණයේ හේතුඵල	15
මනෝවිඤ්ඤාණයේ හේතු වෙනත් ආකාරයකට දැක්වීම	17
අතීත විඤ්ඤාණ	19
ආරම්මණ ප්‍රත්‍යය	19
විඤ්ඤාණය සහ විඤ්ඤාණවාදය	20
විඤ්ඤාණයේ අනිත්‍යය වැඩීම	21
සංඥාවේ ප්‍රභේද	22
සංඥාවේ අනිත්‍යය	23

විඤ්ඤාණය

අතට ලැබුණු වාසනාව

බුදුරජාණන්වහන්සේ දේශනා කළ ධර්මය හමුවීමට තරම් අපි වාසනාවන්තයෝ වීමු. නමුත් එය අපගේ ජීවිතයට හැම මොහොතකදීම ගලපාගැනීම ඉතා දුෂ්කර වී ඇත. ඒ නිසා අපි ධර්මය හදාරා, පොත් කියවා, බණ අසා සාධුකාර දී නැවත අපගේ පරණ ජීවිතයටම බැස දුකසේ ජීවත් වන්නෙමු. ජීවිතයේ ගතවන සෑම තත්පරයක්ම ධර්මයට ගලපා ගැනීමට නොහැකිවීමම අපව නැවත ලෝදිය බීමකට, තණකොළ කෑමකට හෝ සෙම් සොටු අනුභවයකට තල්ලු කරනු ඇත. මෙය මහා අවාසනාවකි. සමහරවිට මරණයෙන් පසු නරක තැනක ලබන උත්පත්තිය තව කල්ප කෝටි ගණනකට මේ ධර්මය හමුවීම අපට අහිමි කරයි.

ධර්මයේ සඳහන් විඤ්ඤාණය යන වදන ඇසෙත්ම සිතට හැඟෙන්නේ මොනවාදැයි ඔබම ඇස්දෙක වසා මොහොතක් සිතා බලන්න. සමහරු මෙය ආලෝකයක් ලෙසද, ආත්මය අඩංගු ශක්ති විශේෂයක් ලෙසද, නැතහොත් අපේ ජීවිතය පුරාවට දිවගොස් මරණින් පසුවද දිගටම යන දෙයකැයිද සිතති.

පාලි පදවල අර්ථ දැනගැනීමේ වැදගත්කම

විඤ්ඤාණය, සංඥාව ආදී පාලි වචන මුළු ත්‍රිපිටකය පුරාවටම දැකිය හැකිය. තවත් බොහෝ ධර්ම කරුණු එවැනි වචන සමඟ සම්බන්ධය. පටිච්චසමුප්පාදයේ අංගයක් වශයෙන්ද, පංච උපාදානස්කන්ධයේ අංගයක් ලෙසද, ආයතන හයෙන් එකක් ලෙසද, මායාවක් වැනිවූවක් වශයෙන්ද විඤ්ඤාණය දක්වා ඇත. විඤ්ඤාණය අංගයක්වන පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යතාව නොදක සෝතාපන්න වන්නට පවා නොහැකි බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. ධර්මය ජීවිතයට ගලපාගෙන විඤ්ඤාණය, සංඥාව ආදිය අනිත්‍ය දෙයක්, නැතිවන වෙනස්වන දෙයක් ලෙස මෙනෙහි කරන්නට පෙර ඒවායේ අර්ථ වටහා ගත යුතුය. ඒනිසා විඤ්ඤාණය පිළිබඳව සරල විස්තරයක් මෙහි සඳහන් වෙයි.

විඤ්ඤාණය යන පදයේ අර්ථය

බුදුරජාණන් වහන්සේ එකල මේ විඤ්ඤාණය යන පදය භාවිතා කර ඇත්තේ දැනුවත් බව යන්න සඳහා යැයි කිවහොත් ඔබ පුදුමවනු ඇත. එය ඒ තරම්ම සරලය.

අපට "දැනුනා" කියන විටත් "දැනුන්නැහැයි" කියනවිටත් මෙම විඤ්ඤාණය ගැනයි කතාකරන්නෙ. "දැනගන්න ඔනේ" කියන විටත් විඤ්ඤාණය ඇතිකරගන්න තමයි කතා කරන්නේ.

මම මේ මේ දේවල් දන්නවා යයි කියා උජාරුවට ප්‍රකාශ කරන විට මාන්නය නැමති කෙලෙසය හටගෙන. විඤ්ඤාණය හෙවත් දැනුවත්බව අරමුණු කරගෙන. "දන්නේනැහැ" කියන විට හීනමානයක් එන්න පුළුවන්. "එයා මොනවද දන්නේ" කිව්වම අපි වෙන පුද්ගලයෙකුගේ විඤ්ඤාණය නැතහොත් දැනුවත්බව අරමුණු කරගෙන තමයි කතා කරලා තියෙන්නේ.

මේ දැනුවත් බව හෙවත් විඤ්ඤාණය අප කැමතිවන දෙයක්, තණ්හා කරණ දෙයක්. අප පාසැලේ, විශ්වවිද්‍යාලයේ, පාඨමාලාවක ඉගෙනගන්නේ ඒ ඒ විෂයයන් පිළිබඳ තොරතුරුදැන ගන්නයි. අප එම තොරතුරු දැනගෙන දැනුවත්කම් වැඩිකරගන්න කැමතියි. බුදුරජාණන් වහන්සේ සතිපට්ඨාන සූත්‍රයේ විඤ්ඤාණය ගැන මෙසේ දේශනා කර තිබෙනවා.

"චක්ඛුවිඤ්ඤාණං ලෝකේ පියරූපං සාතරූපං
එත්ථේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති"

(දීඝ නිකාය, මහා වග්ගය, මහාසතිපට්ඨාන සූත්‍රය)

චක්ඛුවිඤ්ඤාණය ලෝකයෙහි ප්‍රියදෙයක්, මධුර දෙයක්. උපදනා වූ මේ තෘෂ්ණාව මේ චක්ඛුවිඤ්ඤාණයෙහි උපදී.

මෙසේ විඤ්ඤාණයේ සියලු ආකාර කෙරෙහිම තෘෂ්ණාව උපදින බව දේශනා කර තිබෙනවා.

විඤ්ඤාණය සහ ජීවත්වීම

අතීත සිද්ධි ගැන දැනීමක් හෝ වර්තමානයේ පෙනෙන, ඇසෙන, දැනෙන දෙයක් හෝ අනාගතයේ වෙන්නයන දෙයක් ගැන දැනීමක් හෝ හටගෙන නැත්තම් ඒවගේම තමාගේ මානසික ස්වභාවයක් ගැන හෝ බාහිර කෙනෙක් හිතන පතන දෙයක් ගැන හෝ දැනුවත් බවක් හටගෙන නැත්නම්, එනම්, දැනුවත්වීම් කිසිවක් මේ වෙලාවෙ ඇතිවෙලා නැත්නම් අපේ ජීවිතය නැහැ වගේ. හරියටම සිහිනැති කරලා වගේ. එනිසා මේ විඤ්ඤාණය හටගන්නවා යන්න මූලික කරගෙන තමයි අපි ප්‍රධාන වශයෙන්ම ජීවත්වනවා කියලා කියන්නේ. මේ දැනුවත්වීම් මුකුත්ම නැත්තම් අපට තීරණයක්වත් ගන්න බැහැ. කිසිවක් කරන්නත් බැරිවෙනවා.

විඤ්ඤාණයේ ප්‍රභේද

බුදුරජාණන්වහන්සේ මේ දැනුවත්බව හටගන්නා ආකාර හයක් දක්වූ සේක.

- ඇස මූලිකව හටගන්නා දැනුවත්බව (චක්ඛුවිඤ්ඤාණය)
- කන මූලිකව හටගන්නා දැනුවත්බව (සෝතවිඤ්ඤාණය)
- නාසය මූලිකව හටගන්නා දැනුවත්බව (ඝාණවිඤ්ඤාණය)
- දිව මූලිකව හටගන්නා දැනුවත්බව (ජිව්හාවිඤ්ඤාණය)
- කය මූලිකව හටගන්නා දැනුවත්බව (කායවිඤ්ඤාණය)
- මනස මූලිකව හටගන්නා දැනුවත්බව (මනෝවිඤ්ඤාණය)

අපි සිතමු ඉදිරියේ අවට පරිසරයේ ගස්, ගෙවල් දොරවල්, සත්තු පුද්ගලයෝ පේනවා කියලා. පෙනීම ඇස හේතුවෙන් සිදුවුවක් බව පැහැදිලියි. පේනවා කිව්වේ චක්ඛු විඤ්ඤාණයටම කියන තවත් වචනයක්. ඇසෙන් හටගන්නා පෙනීම චක්ඛුවිඤ්ඤාණයයි. පත්තරයක් බලනවා කියන්නේ ඇසෙන් දැනුවත්වීමයි. චක්ඛුවිඤ්ඤාණ ඇති වීමයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කලා,

"චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං"

(සංයුක්ත නිකාය, සළායතන සංයුක්තය, උපස්සුති සූත්‍රය)

ඇසත් රූපයත් හේතුවෙන් චක්ඛුවිඤ්ඤාණයක් උපදින බව.

පෙනීමට මූලික හේතු ලෙස ඇසත්, රූපත් දක්වන්නට පුලුවනි. අපට පෙනෙන අවස්ථාවලදී විවිධ වස්තුවල දිග, පළල ගැඹුර, ලොකු පොඩි බව යම් වස්තුවක් හා අනෙක් වස්තු අතර ඇති පරතරය දැනගැනීමට ලැබෙයි. එම දැනගැනීමත් චක්ඛුවිඤ්ඤාණය ලෙස දැක්විය හැකිය.

ඒ ඒ දේවල දිග, පළල, ගැඹුර ආදිය දන්න නිසා , දැනෙන නිසා තමයි පඩිපෙළක් බහින විට නොවැටී අපට කකුල තියන්න පුළුවන්. එක බැල්මෙන් මේසයක් උඩ තියෙන වස්තු මොනවාද කියා දැනගන්නත්, මේසය උඩ ඇති වස්තුවක් සොයාගන්නත් පුළුවන්.

යමක් අහනවනම් එතන ඇසීම තියෙන්නේ කන උපකාරයෙන්වන දැනුවත්වීමයි. තව විදියකට කියනවනම් සෝත විඤ්ඤාණයයි.

අපට මල් සුවඳ දැනෙනවා කියන්නේ නාසය උපකාරයෙන් දැනුවත්වනවා මල් සුවඳ ගැන. තමන් අඳින වස්ත්‍රයක ගඳ සුවඳ ගැන,

ශරීරයෙන් හමන ගඳ සුවඳ ගැන, හුස්මක් පිටකරලා ගඳක් එනවාදැයි දැනුවත්වීම ඝාණවිඤ්ඤාණයයි

බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය නිදසුනකින් මෙසේ දක්වූ සේක.

"අම්බිලම්පි විජානාති, තිත්තකම්පි විජානාති,ලෝණිකම්පි විජානානි..."

(සංයුත්ත නිකාය, ඛන්ධක වග්ගය, ඛජ්ජනීය සූත්‍රය)

- ඇඹුල් රසය දැනගන්නවා
- තිත්ත රසය දැනගන්නවා
- ලුණු රසය දැනගන්නවා

දිවේ ගාලා හොද්දේ ස්වභාවය දැන ගන්නවා. ලුණු අඩුද, වැඩිද, මිරිස් අඩුද වැඩිදැයි දැනගන්නවා. දිව ඇසුරු කරගෙන බාහිර ස්වභාවයක් ගැන දැනගන්නවා. ආහාරයක රසය දැනගන්නවා. එම දැනගැනීම යනු ජිව්හා විඤ්ඤාණයයි.

අපට දැනුනොත් දැන් හරි රස්නෙයි, දහඩිය දාලා කියලා එතන දැනුවත්කම කියන්නේ කායවිඤ්ඤාණයටයි. කයේ කොතැනහරි රිදීමක් දැනෙනකොට, මෙතනයි රිදෙන්නේ කියන විට, ඒ කායවිඤ්ඤාණයයි.

මෙවන් අකාර වූ විඤ්ඤාණ කොහෙවත් ගමන් කරන දෙයක් හෝ යන එන දෙයක් නොවේ. මරණින් මත්තේ යන දෙයක් නොවේ. යමක් පිළිබඳ දැනීමක් පමණයි. බලනවා, දකිනවා, අහනවා, දැනෙනවා මේ සියලු වචනවලින් අප දවස තුළම කථාකරලා තියෙන්නේ විවිධ ඉන්ද්‍රියන්වලින් ඇතිවූ විඤ්ඤාණවලටයි, නැතිව ආලෝකයකට හෝ ශක්තියකට හෝ නොවෙයි. ඒ වගේම ජීවිතය පුරාවටම එකම එක විඤ්ඤාණයක් නොපවතින බවත් ඔබට පැහැදිලි ඇතැයි සිතමි. ඒ නිසා විඤ්ඤාණය ඒ ඒ අවස්ථාවල, ඒ ඒ හේතූන් නිසා හටගෙන එම හේතූන් නැතිවී යාමෙන් නැතිවීයන දෙයක් ලෙස දැක්විය හැකිය.

ඉන්ද්‍රිය හය සහ විඤ්ඤාණය

අපේ ඇස, කන, නාසය, දිව සහ කය යන පංචඉන්ද්‍රියෙන් ගොචරවුනේ වර්තමාන රූප, ශබ්ධ, ගන්ධ, රස ,පහසයි. පංච ඉන්ද්‍රියෙන් ඊයේ හෝ හෙට හෝ දේවල් බලන්න , අහන්න බැහැ ,දැනෙන්නේ නැහැ. අතීත, අනාගත දේවල් අරමුණු කරන්න බැහැ. දැන් තියෙන ශබ්ද ඇසීමයි සෝත විඤ්ඤාණයෙන් වෙන්නේ. දිවට දැන් තියෙන රසයක්

තමයි දැනෙන්නේ. නමුත් අපේ මනසට අතීත , වර්තමාන, අනාගත තුන්කාලයෙන් ඕනෑම දෙයක් අරමුණුවන්න පුළුවනි.

මනෝවිඤ්ඤාණය ප්‍රායෝගිකව

කාලයකට කලින් තමන් අපහසුතාවයට පත්වෙච්චි අවස්ථාවක්, තමන් බැනුම් අහපු අවස්ථාවක් මතක්වුනා කියන්නේ අතීත අරමුණක් හේතුකරගෙන මනෝවිඤ්ඤාණයක හටගැනීමයි. අතීතයේ උණ ගැනිලා විඳපු වේදනාවක් දැනුනානම් ඒ දැනීම කියන්නේ අතීත වේදනාවක් අරමුණු කරගෙන හටගත්ත මනෝවිඤ්ඤාණයකටයි.

විවිධ ලෙඩ හැදිලා අතීතයේ ගතකල කාල පරිච්ඡේදවල අප ගතකළ ආකාරය, සුළු අමාරුවකින්ද, තදබල අමාරුවකින්ද, ඒ කාලවල අධික කායික වේදනා දැනුන ආකාරය පිළිබඳව දැන් මතකවීම කියන්නේ මනෝවිඤ්ඤාණයටමයි.

ටික වේලාවකට කලින් තරහ ගියානම් මට ඉස්සෙල්ලා තරහ සිතක් හටගත්තේ කියලා හැඟෙනකොට පරණ තරහා සිත අරමුණු කරගෙන හටගන්නේ මනෝවිඤ්ඤාණයයි.

ඇස් වහගෙන සිටින වෙලාවට අපට අවට දැනෙනවා. තමන්ගේ ගෙදරනම් ඇස් වහගත්තත් මෙතන මේසය, මෙතන ඇඳ කියලා දැනුවත්. ගෙදර ලයිට් ගිය වෙලාවක මේ මේ බඩු මේ මේ දුරින් තියෙනවා කියලත් දන්නවා ඒනිසා යම් මට්ටමකට බඩුවල නොහැප්පී ඒ අතරින් යන්න පුලුවන්කමක් තියෙනවා. මේ දැනුවත්බවත් මනෝවිඤ්ඤාණයලෙස සලකනවා.

අනාගතයේ මෙන්න මෙහෙම සිද්ධවේවි කියලා දැනෙනවා. මේ වීදුරු භාජනය මෙතන තිබ්බොත්, මේක කැඩිලා බිදිලා යයි කියලා දැනෙනවා. මෙය අනාගත රූපයක ආකාරයක් පිළිබඳව දැනීමයි. ලෙඩා තුවාලයට බෙහෙත් නොදැම්මහොත් තුවාලේ පැසවලා කපලා සුද්ධ කරන්නත් වෙයි. කියලා දැනෙනවා. මෙලෙස අනාගතයේ විය හැකි සිද්ධියක්, අනාගතයේ විදින්න විය හැකි වේදනාවක්. අරමුණු කරගෙන දැනුවත් වීමත් මනෝවිඤ්ඤාණයයි.

මෙසේ විවිධ වූ ජීවිතයේ අවස්ථා දක්වූයේ විවිධ අරමුණු ඔස්සේ ඇතිවන විවිධ වූ මනෝවිඤ්ඤාණ තෝරා ගැනීමටයි.

අපේ ජීවිතේ හැඟෙන දේවල් මේ ධර්මයේ වචනවලට සම්බන්ධ කරගන්න ඕනෙ. සිතට දැනෙනවා ,සිතෙනවා, හැඟෙනවා, මේ කියන්නේ

මනෝවිඤ්ඤාණය ගැනම තමයි. මෙ සරල අවබෝධය අපට නැත්නම් ධර්මය අනෙකක්, ජීවිතය අනෙකක් වනවා.

විඤ්ඤාණය සහ වේදනාව

විඤ්ඤාණය සමඟ වේදනාවත් හටගන්නවා. ඥාතියෙක් මියගිය බව දැනගන්නවාත් සමඟම ශෝකය නැතහොත් දුක් වේදනාව හටගන්නවා. සමහරවිට ඥාතියා මිය ගිහිල්ලා නමුත් අපි දන්නේ නැත්නම් එවිට දුක් වේදනාවක් ඇතිවන්නේ නැහැ.

අපි කැමති කෙනෙක් ගෙදර ඇවිත් කියලා දැනගන්නවාත් සමඟම සතුටක් නැත්නම් සැප වෙදනාවක් හටගන්නවා. අප කාමරයක සිටියේ නම්, ඒ තැනැත්තා ආවත් තාම අපට සතුට නම් ඇතිවන්නේ නැහැ. මොකද අප දන්නේ නැති නිසා . ඒ නිසා විඤ්ඤාණය සමගම වේදනාවත් හටගන්නා බව අපට තේරුම් ගන්න පුළුවනි.

විඤ්ඤාණය සහ සංඥාව

සංඥාව විඤ්ඤාණය සමඟ එකට හටගන්නා දෙයක් සංඥාව යනු හඳුනාගැනීමයි.

ෆොටෝ එකක් දැක්ක ගමන් මේ මගේ අම්මා, මේ මගේ තාත්තා, මේ මගේ දරුවා කියලා හඳුනාගන්නවා. ඒ සංඥාවයි. දුරකථනයෙන් කථාකරන කෙනා ඇහුවම කටහඬ හඳුනගන්න පුලුවන්ද කියලා. එවිට අපි කියනවා ඔයාව හඳුනනවා කියා. ඒ හැඳිනීමම තමා සංඥාව.

කලින් අපි අත්විදලා හුරුවක් තියනවා, නැවත දකිත්දි, අහත්දි, හඳුනගන්නවා. වාහන ගොඩක් අතරින් අපේ වාහනය හඳුනගන්නවා. වස්තු ගොඩක් අතරින් තොරාගැනීමත් සිද්ධවෙන්නේ සංඥාව උපකාරී කරගෙන.

බුදුරජාණන්වහන්සේ දේශනා කළා,

"නීලම්පි සඤ්ජානාති, පීතකම්පි සඤ්ජානාති, ලෝහිතකම්පි සඤ්ජානාති, ඕදාතම්පි සඤ්ජානිතීති"

(සංයුත්ත නිකාය, ඛන්ධ සංයුත්තය, ඛජ්ජනීය සූත්‍රය)

නිලද හඳුනාගන්නවා, කහද හඳුනාගන්නවා, රතුද හඳුනාගන්නවා, සුදද හඳුනාගන්නවා

කව්රුහරි නිල්පාට පෙන්නලා මොනපාටද මිනිස්සු මේ පාටට කියන්නේ කියලා ඇහුවම, අප දන්නවා මේ කහ නොවේ, රතු නොවේ, අනිත් ඒවා නොවන බව සහ එය එයම බව නැත්තම් එය නිල්පාට බව මේ හඳුනාගැනීමයි සංඥාව.

අපි පාරේ යන වෙලාවක හදිස්සියේ අපේ මිතුරෙක් දකිත්දි මේ මගේ මිතුරෙක් කියලා සංඥාව එනවා. අපට අනිත් මිනිස්සු දැක්කාට එහෙම සංඥා එන්නේ නැහැ. ඒ නිසා හඳුනාගන්න බැහැ.

ඒවගේම අනිත් දරුවන් අතුරින් තමාගේ දරුවා හඳුනාගැනීම, අනිත් නිවෙස් අතරින් තමාගේ නිවස හඳුනාගැනීම වැනි සංඥා අපට එදිනෙදා ජීවිතය ගත කිරීමට අතිශයින් උපකාරී වෙනවා

විඤ්ඤාණය සහ සංඥාව අතර වෙනස

විඤ්ඤාණයයි සංඥාවයි අතර වෙනස අප තේරුම් ගත යුතුයි. ගහක තියෙන වතුසුද්ද මලක් දකින විට අප හඳුනගන්නවා එය වතුසුද්ද මලක් බව. ඒ හැඳිනීමටය සංඥාව කියන්නේ. ඒත් එක්කම අප දන්නවා ඒ මලේ ප්‍රමාණය, පෙති ගණන, ඒ මල ගහේ කොතනද පිහිටලා තිබුනේ, ඒ මලයි ගහයි, තමනුයි අතර විවිධ දුර ප්‍රමාණයන්. මේ දැනුම තමයි විඤ්ඤාණය.

සංඥාව හා විඤ්ඤාණය සරලව මෙසේ පහසුවෙන් වෙන් කරගත හැකියි.

ඔබ ඒ මල හඳුනනවාදැයි යමෙක් ඇසුවොත් ඒ ඔබෙන් අසන්නෙ එම මල ගැන ඇති සංඥාව ගැනයි.

ඔබ ඒ මලේ පෙති ගණන දන්නවාද, මලේ ප්‍රමාණය, ගහේ කොතනද මල පිපිලා තිබුනේ, කියා දන්නවාදැයි ඇසූ විට ඒ ඔබෙන් අසන්නේ ඒ ගැන ඔබ ඇතිකරගත් විඤ්ඤාණය ගැනයි.

ඔබ රිය අනතුරක් දුටුවා යැයි සිතමු. පසුව කෙනෙක් ඒ ගැන ඇසුවොත් මෙන්න මෙදා මෙවන් ආකාරයේ රිය අනතුරක් වූවාදැයි දන්නවාද කියා, ඔබ පිළිතුරු දෙනවා "මම දන්නවා" කියා. එවැනි සිද්ධියක් වූවායැයි දන්නා බව විඤ්ඤාණයයි. නමුත් ඔබෙන් කවුරුවත් අහන්නේ නැහැ ඔබ රිය අතනුරක් සිදුවුවාදැයි හඳුනනවාද කියා.

එම වාහනය දැක්කොත් හඳුනාගන්නට පුළුවන්දැයි ඇසුවහොත් "ඔව්" යැයි කියා පිළිතුරු දෙන්නේ ඔබට එම රූපය නැතහොත් වාහනය ගැන සංඥාව ඇතිවී තිබුනහොත්ය.

රිය අනතුරක් දකින අවස්ථාවක මෙය මොටර්සයිකලයක් බස්එකක්, මිනිහෙක් යැයි හැඳුනුම්කම් සියල්ල ඔස්සේ රිය අනතුරක් වනබව දැනුවත්වීමක් ලබනවා. ඒ ඒ දේ හඳුනාගනිමින් රියඅනතුරක් වන බව දකිනවා, දැනුවත්වෙනවා. ඒ නිසා මෙහිදී සංඥාවල එකතුවෙන් ඇතිවෙනවා විඤ්ඤාණයක් හෙවත් දැනුවත්වීමක්.

සංඥාවටත් හේතුව විඤ්ඤාණය ලෙසද දක්විය හැකියි. දිග පළල, ගැඹුර, වස්තු අතර දුර මගින් ආකෘතිය හදලා වස්තුව තේරුම් ගන්නට පස්සේ තමයි එය හඳුනාගන්නේ. මොටර්සයිකලයක් , බස්එකක්, මිනිහෙක් කියලා හඳුනාගන්න ඒ ඒ වස්තුවල දිග, පළල, ගැඹුර, වස්තුව අතර දුර වැනි දැනුවත්වීම් අවශ්‍යයි.

හඳුනාගනිමින් දැනුවත්වෙනවා. ඒ වගේම දැනුවත්වෙමිනුත් හඳුනාගන්නවා. මෙලෙස අඤ්ඤමඤ්ඤව එකිනෙකාට උපකාර කරමින් , සහසම්බන්ධව විඤ්ඤාණය සමඟ එකටම සහජාතව සංඥාව උපදිනවා. එකටම නිරුද්ධ වෙනවා.

විඤ්ඤාණය සහ චේතනාව

විඤ්ඤාණය සමඟ හටගන්නා තවත් නාම ධර්මයක් තමයි චේතනාව.

අපේ කකුලේ කොතන හරි රිදෙනවා කියලා දන්නවානම් එම ඉරියව්ව වෙනස් කිරීමේ වුවමනාවක් එනවා එය කය අනුව ගිය චේතනාවක්. මදුරුවෙක් විදිනකොට උඟව මරන්න ඔනෙ කියල එන මේ වගේ කය අනුව ගිය චේතනාවලට කායසංචේතනා කියනවා.

යමෙක්, යමක් අහනවිට මෙයට මේ මේ විදියට උත්තර දෙන්න ඕනා කියලා හිතෙනකොට ඒ හිතන ගතිය වචනය අනුවගිය චේතනාවක්. ඒවාට වචීසංචේතනා කියලා කියනවා.

මනසින්ම, දැන් මනස මේ පැත්තට යොමුකරන්න ඕනෙ, මේ වගේ සිතන්න ඕනේ, එවැනි අවස්ථාවක ඇත්තේ මනෝසංචේතනා.

මෙම චේතනා නිසා ජීවිතය සකස් වුනා. ඒනිසා මේ චේතනා සංඛාරස්කන්ධය යටතේ දක්වලා තියෙනවා. හැබැයි සංස්කාර ස්කන්ධය කිව්වාම අපට එන චේතනා වගේම තවත් මානසික ධර්ම සමූහයක් ඊට ඇතුළත් වෙනවා. වේදනාවත්, සංඥාවත් හැර, අපට එන අදහස්, විශ්වාස, තණ්හා ආශා, තරහව, ඊර්ෂ්‍යාව, වෛර, ක්‍රෝධ වගේ, අනෙක් සියලු මානසික ධර්ම සංස්කාරස්කන්ධය තුළට ඇතුළත් වෙනවා. ඒවා තුළින් එකිනෙකාගේ ජීවිත සකස්වෙනවා.

මෙම සංස්කාර අනිත්‍යයි කීවාම, තමාගේත් අන්අයගේත් අදහස්, තරහ, ආසා වෙනස්වෙලා නැතිවෙලා යනවා වැනි හැඟීමක් අපට එන්න ඕනෙ. උදාහරණයක් ලෙස මෙම පුද්ගලයාට තිබෙන්නේ මෙවැනි අදහස් යැයි පවසන විට අපේ සිතේ තිබෙන්නේ එම අදහස් ගැන නිත්‍ය සංඥාවක්. නමුත් අන්අයගේ අදහස්, විශ්වාස, හැඟීම් වගේම තමාගේ අදහස්, විශ්වාස හැඟීම්වල අනිත්‍ය බව නිතර සිහිවීම තුළින් අපට දැනෙන පීඩාවන් බොහෝ සේ අඩුකර ගැනීමට පදනම වැටෙනවා.

විඤ්ඤාණය ඇතිවීමට හේතු

"චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, සෝතඤ්ච පටිච්ච සද්දේ ච උප්පජ්ජති සෝතවිඤ්ඤාණං"

(සංයුක්තනිකාය,සළායතනසංයුක්තය,සබ්බුපාදානපරිඤ්ඤා සූත්‍රය)

ඇසත් රූපයත් හේතුවෙන් ඇසෙන් හටගන්නා දැනුවත්බව උපදී. කනත් ශබ්දයත් හේතුවෙන් කනෙන් හටගන්නා දැනුවත්බව උපදී.

මේ ආකාරයට ඇස, කන,නාසය, දිව ,කය යන පංච ඉන්ද්‍රියෙන්ම දැනුවත්වීමට හෙවත් විඤ්ඤාණ හටගැනීමට එම ඉන්ද්‍රියනුත් ඒවාට ගෝචරවන රූප, ශබ්ද, ගන්ධ,රස, පහස යන දැත් හේතුවන බව පැහැදිලිය.

පටිච්චසමුප්පාදයට අනුව විඤ්ඤාණයේ හේතුඵල

"අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං , නාමරූප පච්චයා සළායතනං...."

(සංයුක්තනිකායෙ, නිදානවග්ග පාලි, පටිච්චසමුප්පාද සූත්‍රය)

"අවිද්‍යාව හේතුවෙන් සංස්කාරත්, සංස්කාර හේතුවෙන් විඤ්ඤාණයත්, විඤ්ඤාණය හේතුවෙන් නාමරූපත් ,නාමරූප හේතුවෙන් සළායතනත්, උපදියි..."

"අවිජ්ජා පච්චයා සංඛාර, සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්න ගැන උදාහරණයකින් සලකා බලමු.

රූපවාහිනිය බලන්න ආශාවක් ඇතිවනවිට එය දැකගන්න ආශා කරන්නේ, එය දුකක් කියලා හෝ දුකකට හේතුවන දෙයක් හෝ කියලා දැනුවත් නැති නිසා. එතනම අවිද්‍යාව තියෙනවා. ඒනිසා එය බැලීමේ චේතනාවක් එනවා. එය තමයි සංඛාරය. ඒ චේතනාව නිසාම

රූපවාහිනියෙන් යමක් දැනගන්නවා. චේතනාව නිසා ඇතිවනුයේ විඤ්ඤාණයක්, දැනුවත් බවක්. එදිනෙදා ජීවිතයේදී මේ චේතනාව නිසා අපට නොයෙක් විඤ්ඤාණ ඇතිවෙනවා. කෑමක් කන්න ඕනෙ කියන චේතනාව නිසා ජිව්හාවිඤ්ඤාණය ඇතිවෙනවා. ජිව්හාවිඤ්ඤාණය ඇතිවෙනවා කියන්නේ ආහාර ගනිත්දී එම ආහාරයේ තියෙන රස, ගුණ අගුණ ගැන දැනුවත් වීමය. හැරිල යමක් බලත්දි, පත්තරයක් බලත්දි සංඛාර පච්චයා විඤ්ඤාණං යන්නයි ක්‍රියාත්මකවී ඇත්තේ. **"අවිජ්ජා පච්චයා සංඛාර, සංඛාර පච්චයා විඤ්ඤාණං"**යන්නෙන් තවත් නොයෙක් හේතුඵල ක්‍රියාවලි අදහස් වන අතර, ඉහත දැක්වූයේ ඉන් එක් සරල උදාහරණයක් පමණයි.

"විඤ්ඤාණ පච්චයා නාමරූපන්ති" මෙහි නාමරූප යන්නෙහි නාමය යනු එකකි. රූපය යනු තව එකකි. යමක් දැනුවත්වෙද්දි හටගන්නා ස්පර්ශය, වේදනාව, සංඥාව, චේතනාව, මනසිකාරය ආදිය නාමධර්ම ලෙස දැක්විය හැකිය. රූපලෙස සතරමහා භූතත්, උපාදාය රූපත් දැක්විය හැකිය.

මෙම අවස්ථාව තවත් පැහැදිලි කර ගනිමු. සමහර සිද්ධිවලදී සතුටක් එනවා , කැමැත්තක් එනවා. තමන්ගේ පවුලේ කෙනෙක් නැතිවුනා කියලා දැනුවත් වෙන කොට ශෝකයක් එනවා. එම දැනුවත්බව නැතහොත් විඤ්ඤාණය හටගන්නවාත් සමගයි එම වේදනාව හටගත්තේ.

අවට පරිසරයේ රූපයත් ඇසෙන් දැනුවත්වනවිට එය හඳුනා ගැනීමකුත් සිද්ධවෙනවා. මේ මගේ අම්මා, තාත්තා, සතෙක්, මිනිසෙක් ලෙස හඳුනාගන්නවා, සංඥාවක් ඇතිවෙනවා. විඤ්ඤාණය ඒ මොහොතේ සහජාතව, එනම් එක්ව උපදින ලෙස හඳුනාගන්න උපකාර වෙනවා.

දැනුවත්වන විටම චේතනාවක් හටගන්න පුලුවන්. එවිට යමක් දැනගන්නාවිටම ක්‍රියාත්මක වෙන්න හිතෙනවා. ඉදිරියෙන් පුද්ගලයෙක් ඉන්නවා කියලා දැනගන්නවා. එනිසා යමක් කියන්න හිතෙනවා. වතුර කෝප්පයක් ඉදිරියේ තියෙනවා කියලා දැනුවත්වනවාත් එක්කම අරගෙන බොන්න හිතෙනවා. ඒ තැන්වලදී සිදුවුනේ විඤ්ඤාණය නිසා චේතනා ඇතිවීමයි.

ඒවගේම අපට දැනෙත්දිම තමයි ස්පර්ශයත් කියන නාම ධර්මයත් තියෙන්නෙ.

විඤ්ඤාණය හේතුවෙන් රූප හටගන්නා අවස්ථා සලකා බලමු. මනුෂ්‍යයෙකුගේ නම් කලල රූපයත්, ඕපපාතික සත්වයෙකුගේ නම් පරිපූර්ණ රූපය හටගැනීමටත්, විඤ්ඤාණයේ හටගැනීම සහ පැවැත්ම අතිශයින් වැදගත්වනවා.

කලල රූපය පවත්නා කාලයේ පවතින විඤ්ඤාණය යන්නෙන් අප අදහස් කළේ එම අවස්ථාවේ කලලය ආශ්‍රිතව රස්නයක් හෝ තදගතියක් හෝ හිරවෙච්චගතියක් හෝ පිළිබඳව දැනුවත්වන බවයි. මෙයට අමතරව කර්ම ශක්තිය උපකාරයෙන් පවත්නා පසුවට විස්තරවන භවාංග සිතේ පැවැත්මයි.

විඤ්ඤාණය හේතුවෙන් රූප හටගන්නා තවත් අවස්ථාවක් ලෙස අපට තරහ යන විට, ඇගේ ලේ ධාතුව කලඹවීම, හෘදයේ වේගය වැඩිවීම දැක්විය හැකිය. මේවා සිතත් එක්කම පහළ වන ශාරීරික රූප බය වුනහම දාඩිය දානවා. අභිධර්මයේ කියනවා චිත්ත සමුට්ඨාන. නැතහොත් චිත්තජ රූප කියලා. හදවත වැඩකරනවා, හුස්ම ක්‍රියාත්මක වෙනවා. මේ සියල්ලටම සිත බලපානවා.

"විඤ්ඤාජනපච්චයා නාමරූපං නාමරූපපච්චයා විඤ්ඤාණං"

(දීඝ නිකාය, මහාවග්ගය, මහානිදාන සූත්‍රය)

මෙම නාමධර්ම නැවතත් විඤ්ඤාණයටම ප්‍රත්‍යවෙනවා. වේදනා විඳින තරමට ඒ ගැන ඇති විඤ්ඤාණය ප්‍රබල වෙනවා. යමක් හඳුනග න්නා තරමට ඒ ඒ විඤ්ඤාණත් ප්‍රබල වෙනවා. යමක් ගැන සිතා බලන තරමටම අප ඒ දේ ගැන තවත් දැනුවත් වෙනවා. හිතලා හිතලා, මතකය අවුස්සලා, අවුස්සලා, යමක් තේරුම් ගන්නව නම් එතන චේතනාව සහ මනසිකාරය ඔස්සේ යමක් දැනගන්නවා. එනිසා නාමය හේතුවෙන් විඤ්ඤාණය හැදුනා යැයි කිව හැකියි.

මේ ආකාරයට ප්‍රායෝගිකව විඤ්ඤාණය හා අනෙකුත් මානසික ධර්ම ගැන තේරුම් ගැනීමෙන් ඒවායේ අනිත්‍යය ස්වභාවය මෙනෙහි කිරීමට පදනම වැටෙනවා.

හය වැදෑරුම් වූ විඤ්ඤාණයේ ආකාරවලින් එකක්වන මනොවිඤ්ඤාණයේ හටගැන්මට මූලික වන හේතු වෙනත් ආකාරයකට දැක්වීමක්.

"මනඤ්ච පටිච්ච ධම්මේ ච උප්පජ්ජරැතී මනොවිඤ්ඤාණං"

(සංයුක්ත නිකාය, සළායතන සංයුක්තය, සබ්බුපාදාන පරිඤ්ඤා සූත්‍රය)

මනත්, ධම්මත් හේතුවෙන් මනොවිඤ්ඤාණය උපදියි.

බොහෝදෙනාට ගැටළුවක් වී ඇති ඉහත පාඨයේ සඳහන්වන මන, ධම්ම යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි සලකා බලමු.

මන

සත්වයන්ගේ චිත්ත සන්තතිය පැවැත්මට අතිශයින්ම උපකාරීවන කර්ම ශක්තියත් හේතුවී, තණ්හාවත් මූලික වී හටගන්නා, කර්ම ශක්තියෙන්ම ගමන් කරන මූල සිතක් ගැන සාධක ධර්‍මය තුළ සඳහන් වෙනවා. එයට අභිධර්‍මයේ භවාංග යැයිද , භවාංග සිත යැයිද නිතර සඳහන් කර තිබෙනවා. සූත්‍ර පිටකයට අනුව,

"මනෝ භික්ඛවේ පුරාණ කම්මං"

(සංයුක්ත නිකාය, සළායතන වග්ගය, කම්ම නිරෝධ සූත්‍රය)

මන පුරාණ කර්මයෙන් හටගත්තකි යන්නෙන් මෙය අදහස්කළ බවක් පෙනෙන්න තියෙනවා.

මෙම භවයේ අවසානය දක්වා අනෙකුත් චක්ඛුවිඤ්ඤාණ, සෝතවිඤ්ඤාණ ඇතුළු මනෝවිඤ්ඤාණ පහළ නොවන හැමවිටම භවාංග සිත් අතරත් නැතිව හට ගනිමින් නොබිඳී සිත් පරම්පරාව පවත්වනවා. ඒ ඒ අවස්ථාවල භවාංග චිත්ත සන්තතිය කෙළවරින් මනොවිඤ්ඤාණ ඇතුළු අනෙක් විඤ්ඤාණ පහළ වෙනවා. එනිසා මෙම භවාංග චිත්ත සන්තතිය හෙවත් මන, මනොවිඤ්ඤාණ ඇතුළු අනෙකුත් විඤ්ඤාණ හටගැනීමට දැඩි ලෙස උපකාර කරනවා. බ්‍රහ්මයන්ට මූලසිත ලෙස ධ්‍යාන භවාංග සිතක් ලැබෙනවා. ආශ්‍රව ක්‍ෂය කරන ලද රහතන්වහන්සේට කර්මශක්තියෙන් එන භවාංග සිතක් ඊලග භවයක සකස්වන්නේ නැහැ. මක්නිසාදයත්, තණ්හාවත්, කර්මශක්තියත් ඒ සඳහා අවශ්‍ය බැවින්. එනිසා උන්වහන්සේ පිරිනිවන්පානවා.

කාමාවචර සහ රූපාවචර සත්වයන්ගේ කර්මයෙන් හටගන්නාවූ එක්තරා විශේෂිත රූපයක් පදනම් කරගෙන, නිශ්‍රය කරගෙන, මෙම මූලිකසිත හටගන්නවා. අභිධර්‍මයේ මෙම රූපය වස්තු රූපය ලෙස සඳහන්වනවා. සිතට තවත් පරියාය නමක් ලෙස හදය කියා යෙදෙන නිසා හදයට වස්තුවන බැවින් හදයවස්තුව ලෙස මෙම රූපය අටුවාවල දක්වා තිබෙනවා.

ධම්ම

ධම්ම යනුවෙන් විශේෂයෙන්ම මෙතැනදී අදහස් වනුයේ විඤ්ඤාණයට සහජාතව හේතුවන, විඤ්ඤාණයත් සමගම හටගන්නා අනෙකුත් චෛතසිකය.

අනෙකුත් චෛතසික ලෙස ප්‍රධාන වශයෙන්ම ස්පර්ශය, වේදනාව, සංඥාව, චේතනාව, මනසිකාරය ආදිය දැක්විය හැක. මීට පෙර විඤ්ඤාණය සමග හටගන්නා නාමධර්ම ලෙස මෙම අනෙකුත් චෛතසික විඤ්ඤාණයට ප්‍රත්‍යවන ආකාරය පැහැදිලි කරනු ලැබීය.

මන සහ ධම්මවලට අමතරව මනෝවිඤ්ඤාණය හටගැනීමට ප්‍රධාන හේතු ලෙස අතීත විඤ්ඤාණයත් ආරම්මණ ප්‍රත්‍යත් දැක්විය හැකියි.

අතීත විඤ්ඤාණ

මනෝවිඤ්ඤාණයට විශේෂ හේතුවක් ලෙස අතීත විඤ්ඤාණයද දැක්විය හැකිය. නිදසුනක් ලෙස ළමයෙක් සංඛ්‍යා එකතුකරන්න, අඩුකරන්න ඉගෙන ගන්නවා. දැනගන්නවා. සංඛ්‍යා බෙදීම , වැඩිකිරීමත් ඉගෙන ගන්නවා එම දැනීම් සියල්ල එකතුවෙලා ලොකු ගණනක් හදන්න දැන ගන්නවා.

තවත් නිදසුනක් ලෙස වෛද්‍යවරයෙක් ලෙඩෙකුගේ රෝග ලක්ෂණ බලනවා, උණ බලනවා, වෙද නළාවෙන් පපුව අහනවා, ලේ, මුත්‍රා ආදී රිපෝර්ට් බලනවා. ඒ සියල්ල දැනගෙන මෙයයි ලෙඩේ කියලා දැනගන්නවා. මෙතනදි සිදුවුනේ මුල් දැනීම් උපනිශ්‍රය වෙලා අවසානයේ ලෙඩේ ගැන දැනුවත් බවක් ඇතිවෙනවා. අතීත විඤ්ඤාණ හේතු වෙලා අළුත් දැනුවත් බවක් ඇතිවුනා. එනම් අතීත මනොවිඤ්ඤාණ අනාගත මනෝවිඤ්ඤාණයකට හේතුවීමයි, ප්‍රත්‍යවීමයි සිදුවී ඇත්තේ.

ආරම්මණ ප්‍රත්‍යය හෙවත් විඤ්ඤාණයට ආරම්මණයෙන්වන උපකාරය.

විඤ්ඤාණය හට ගැනීමට තවත් හේතුවන ප්‍රධාන කාරණයක්වනුයේ එහි ආරම්මණයයි. මෙය අභිධර්ම පිටකයේ පට්ඨානප්‍රකරණයේ ආරම්මණ ප්‍රත්‍යය ලෙස සඳහන් වෙනවා.

විඤ්ඤාණය යනු පෙර සඳහන් කළ පරිදි යමක් පිළිබඳ දැනුවත්වීමයි. එම දැනුවත් වීමට ගෝචරවන දෙසට අප අරමුණ යැයි කියනවා. උදාහරණයක් ලෙස වර්ණ රූප නිසා චක්ඛුවිඤ්ඤාණ හටගන්නවා. වර්ණ රූප නොවන්නට අවට පරිසරය ගැන දැනුවත්වන්නට බැහැ. එනම් වර්ණ රූපය නැමැති අරමුණක් නැත්තම් චක්ඛුවිඤ්ඤාණය හටගැනීමක් සිදුවන්නේත් නැහැ. එමනිසා වර්ණරූපය ආරම්මණ ප්‍රත්‍යයෙන් චක්ඛුවිඤ්ඤාණයට උපකාරවනවා යැයි කිවහැකිය.

මෙලෙස ශබ්ද අරමුණක් හේතුවී සෝතවිඤ්ඤාණය හටගන්නවා. ගන්ධ අරමුණක් හේතුවී ඝානවිඤ්ඤාණය හටගන්නවා. රස අරමුණක් හේතුවී ජිව්හාවිඤ්ඤාණය හටගන්නවා. පහස නැමති අරමුණක් හේතුවී කායවිඤ්ඤාණය හටගන්නවා.

මනෝවිඤ්ඤාණය හටගැනීමට එයට ගෝචරවන යම් ධර්මයක් තිබිය යුතුයි. එනම් එයට අරමුණක් තිබිය යුතුයි. පංච ඉන්ද්‍රියට ගෝචරවන රූප, ශබ්ද, ගන්ධ, රස, පහස වගේම අතීත දැනුවත්කම්, වේදනා, රාගය ,තරහව, අනාගතයේ සිදුවිය හැකි සිද්ධි, විඳින්න වියහැකි වේදනා ආදී ඕනෑමදෙයක් මනෝවිඤ්ඤාණය හටගැනීමට හේතුවූ අරමුණු ලෙස දැක්විය හැකිය. එම ධර්ම ආරම්මණ ප්‍රත්‍යයෙන් මනොවිඤ්ඤාණය හටගැනීමට උපකාරී වනවා.

අරමුණු තුළට නොවැටෙන දෙයක් නැහැ වගේම මනෝම්විඤ්ඤාණයට ගෝචරනොවන දෙයකුත් නැහැ. අතීත, වර්තමාන, අනාගත, ලඟ, දුර, සියුම්, ගොරෝසු, හීන, ප්‍රණීත, තමන්ගේ, බාහිර වශයෙන් රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන මුළු පංචඋපාදානස්කන්ධයට අයිති ඕනෑම සංඛත දෙයක් වගේම, අසංඛත නිවනත් අරමුණුවී මනොවිඤ්ඤාණයක් හටගත හැකිය. මෙසේ විවිධවූ ධර්මතා මනෝවිඤ්ඤාණය හටගැනීමට ආරම්මණ වශයෙන් උපකාර කළ බව ඔබට පැහැදිලිය.

අරමුණෙන් තොරව ඕනෑම විඤ්ඤාණයක් ගැන කතා කිරීමට නොහැකිය. නමුත් විඤ්ඤාණය යනු අරමුණ නොවේ. උදාහරණයක් ලෙස තමන් අතීතයේ ගතකළ වේදනාත්මක අවස්ථාවක් මතක්වෙද්දී, දැනුවත්වෙද්දී අරමුණ එම අතීත වේදනාවයි. අතීත වේදනාව දැන් වර්තමානයේ විඳින්නේ නැහැ. නමුත් එදා මෙවන් වේදනාවක් මෙවන් අවස්ථාවක තමන් අත්වින්දා කියලා දැන් දැනෙනවා. ඒ මනෝවිඤ්ඤාණයයි. එම විඤ්ඤාණය හටගත්තේ ඒ අරමුණ ගැන දැනුවත්වෙමින්, අරමුණේ බැසගෙන, අරමුණෙන් වෙන්කළ නොහැකි ලෙසයි.

මෙලෙස විඤ්ඤාණය හටගැනීමට ඉවහල්වන හේතුන් හඳුනාග ැනීමෙන්, ආත්මදෘෂ්ටියෙන් බැහැරව මනෝවිඤ්ඤාණ ඇතුළු සියලු විඤ්ඤාණ, හේතුන්ගෙන් හටගන්නා ධර්මතා ලෙස දැකීමට හැකිවෙනවා.

විඤ්ඤාණය සහ විඤ්ඤාණවාදය

අතීත වේදනාව අරමුණක් ලෙස ගෙන දැන් විඤ්ඤාණය හටගත්තත්, නොගත්තත් ඒ ගැන දැනුවත් උනත්, නැතත් මතක්උනත් නැතත් එදා වේදනාව වින්ද බව සත්‍යක්ම බව ඔබ දන්නවා. එනිසා මෙම

අතීත වේදනා ආදී අරමුණු විඤ්ඤාණයෙන් මවනවා කියලා පටලවා ගතයුතු නැහැ. සමහරු තුළ ඇති වැරදි මතයක් වන්නේ අරමුණු මනසින් ප්‍රකල්පනය කරන ඒවා පමණක් බව. අරමුණු යනු විඤ්ඤාණයට හෙවත් දැනුවත්වීමට ගෝචර වන ඕනෑම දෙයකටයි.

සමහරු විඤ්ඤාණය මායාවක් වැනිය **"මායූපමඤ්ච විඤ්ඤාණං"** යන බුද්ධ දේශනාව දක්වා විඤ්ඤාණයෙන් සියල්ල මවනවා, සත්‍යයව පවතින දෙයක් නැහැ යන විඤ්ඤාණවාදයෙන් හැමදෙයක්ම විස්තර කරන්නට යනවා. මෙය වැරදි අදහසක්. මෙතැන වැරදි විපල්ලාස සමඟ තියෙන පෘථග්ජන විඤ්ඤාණය තමයි බුදුරජාණන් වහන්සේ දැක්වූයේ. එහෙම නැතිව කුසල හෝ මනා විදර්ශනා නුවණක් සහිත විඤ්ඤාණය ගැන නොවේ.

දැනුවත්වීමක් වනවිට නැති නිත්‍යතාවක් තිබෙන බවට ආරෝපණය කර ගන්නවා. නැති ආත්මයක් පවතිනවා කියලා හිතාගන්නවා. විඤ්ඤාණයේ ගුණය පමණක් නොවේ, අනෙකුත් චෛතසිකවල ගුණත් සමගයි එතැන සිත දක්වලා තියෙන්නේ, නිදසුනක් ලෙස වැරදි අතට යොමුවූ සිත බොහෝ අනර්ථය පිණිස පවතිනවා කියලා දේශනාවේ තියෙනවා. එතැන සිත කිව්වම අකුසල චෛතසික සමඟයි දක්වලා ඇත්තේ.

විඤ්ඤාණයයි සියල්ල කරන්නෙ, සියල්ල මවන්නේ. ඒනිසා මේ සියල්ල හිස් දෙයක් වැනි වැරදි මතවලට අහුනොවී අප කළයුත්තේ එදිනෙදා ජීවිතයේ ලබන දැනුවත්වීම්, හඳුනාගැනීම් ආදිය හේතුඵල ලෙසත්, එවා අනිත්‍ය බවත් එම අනිත්‍ය ඔස්සේ සියල්ල දුකයි, අනාත්මයි යන්නත් අවබෝධ කිරීමයි.

විඤ්ඤාණයේ අනිත්‍යය වැඩීම

යම් හේතුවක් නිසා හටගන්නා විඤ්ඤාණයක් වේද එම හේතු නැතිවී යාමෙන් එම විඤ්ඤාණය නැතිවී යනවා. උදාහරණයක් ලෙස කනත්, ශබ්දයත්, සෝත සම්ඵස්සයවන කනේ ස්පර්ශයත් නිසා හටගන්නා යම් සෝතවිඤ්ඤාණයක්වේද ඒ හේතූන් නැතිවී යාමෙන් එයද නැතිවී යනවා.

යම් ස්පර්ශයකට අදාළව හටගන්නා විඤ්ඤාණය එම ස්පර්ශය නැතිවී යාමෙන් එම මොහොතේම නැතිවී යනවා. මෙහිදී කනේ ස්පර්ශය නිසා හටගන්නා වු සෝතවිඤ්ඤාණය එම ස්පර්ශය නැතිවී යාමෙන් නැති වුනා. ඒවගේම එහිදී ගෝචරවන අරමුණ නැතහොත් එම ශබ්දය නැතිවී යාමෙන් එම විඤ්ඤාණය නැතිවනවා.

එනිසා අපට කියන්න පුළුවන් මේ දැනීම නැතහොත් විඤ්ඤාණය අනිත්‍යයි කියලා. යමක් අනිත්‍යය නම් එය දුක්වූ දෙයක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

සිත දියුණු කරගත්තොත් , සමාධිමත් නම් එක අරමුණක දැනීම පවත්වන්න පුළුවන් නැත්නම් අපට කැමති ආකාරයේ දැනීම් දිගටම පවත්වන්න බැහැ. කිසිම දැනීමක් නැතිව ඉන්නත් බැහැ.

යම් අකමැති දෙයක් මට නොඇසේවා, නොදැනේවා, නොසිතේවා කියලා ප්‍රාර්ථනා කළාට අපට කයේ මෙතන රිදෙනවා, අතන රිදෙනවා කියලා දැනෙනවා, නැත්නම් අතීතයේ හෝ අනාගතයේ හෝ දෙයක් ගැන දැනුවත්වෙනවා.

විඤ්ඤාණයට තමන් ස්ථිරව, නිත්‍යව පවතිමින් අනිත් දේවල් තමන් වසඟයේ පැවැත්වීමට නොහැකි නිසා එය අනාත්මද වෙනවා.

ඒවගේම සාමාන්‍ය පෙළ, උසස් පෙළ කරන කාලයේ ඉගෙනගත්ත, දැනගත් දේවල් ඇහුවොත් අප කියන්නේ දැන්නම් ඒවා දන්නෑ කියලා. ඒ දැනුවත්කම් දැන් නැතිවෙලා දැනුවත් බව වයසට යනවිටත් පරණ දැනුවත්වීම් නැතිවෙනවා, කලින් ලැබුණ දැනුම් දැන් නැතිවෙලා ගිහිල්ලා.

පරණ දැනුම නැතිවී අලුත් දැනුමක් හටගෙන. සමහරවිට පරණ දැනුම නිසා අලුත් දැනුමක් හටනොගන්නත් පුලුවන්. ඔබට මතක් වෙනවා කියන්නේ පරණ දැනුම් නිසා, ඒවා හේතුවෙලා අලුත් දැනුම් හටගන්නවා කියන එක. පරණ දැනුවත්වීම් ස්ථිරව නිත්‍යව තියනවා කියන එක නොවේ.

පසුගිය භවයේදී අප දැනගත් දේවල්, දැනුන දේවල්, එම දැනුම දැන් නැතිවෙලා. මේ විඤ්ඤාණයේ අනිත්‍යයි.

තවද විවිධවූ අරමුණු ඔස්සේ විවධ වූ විඤ්ඤාණ හටගත්බව හඳුනාගෙන, ඒ තුළින් විඤ්ඤාණය පිළිබඳව අනිත්‍ය සංඥාව වැඩිය හැක.

සංඥාවේ ප්‍රභේද

විවිධ සංඥා වර්ග ලෙස නිත්‍ය සංඥා, අනිත්‍ය සංඥා, සුඛ සංඥා, දුක්ඛ සංඥා, ආත්ම සංඥා, අනාත්ම සංඥා, සුභ සංඥා, අසුභ සංඥා, පටිකූල සංඥා ආදිය දැක්විය හැක.

"අනිච්ච සඤ්ඤා, භික්ඛවෙ, භාවිතාය බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං- දිට්ඨෙව ධම්මේ අඤ්ඤා, සතිවා උපාදිසෙස අනාගාමිතා...."

(සංයුක්ත නිකාය, මහාවග්ගය, බොජ්ඣඞ්ංග සංයුක්තය, නිරොධ වර්ගය ,අනිච්ච සූත්‍රය)

මහණෙනි, අනිත්‍ය සංඥාව දියුණු කරගත් විට බහුලව පුරුදු කරගත්විට, ඵල දෙකක් අතුරින් එක්තරා ඵලයක් කැමතිවිය යුත්තේය. මෙලොවදීම අරහත්බව හෝ උපාදාන ඉතිරිව තිබේනම් අනාගාමී හෝ බවයි.

ධර්‍මයේ දක්වා ඇත්තේ අනිත්‍ය සංඥා ආදී කුසල සංඥා, බහුලීකෘත කරන ලෙසය.

යම් රූප, වේදනා ආදී සකස්වූ ධර්‍මයක් දුනෙත්දී එය නිත්‍ය නොවන දෙයක් ලෙස හඳුනාගැනීමයි අනිත්‍ය සංඥාවය. නිදසුනක් ලෙස රූපයේ ආකාරය අරමුණුවෙනවාත් සමඟ එහි තව ලක්ෂණයක් විදියට අපට වැටහෙනවා. එය නිත්‍ය නොවන වෙනස්වන දෙයක් කියලා, අපට හැඟෙ නවා, අප හඳුනාගන්නවා, එවැනි දේවලට කියනවා අනිත්‍ය සංඥාව කියලා.

තමාගේ දරුවා දක්කම මෙතන නිත්‍ය සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවා කියලා නිත්‍ය සංඥාව තියෙනවා. නමුත් දරුවා හඳුනාගන්නවාත් සමඟම මේ දරුවා හටගත්ත, වෙනස්වෙමින් පවතින, නැතිවන දෙයක් ලෙසද හඳුනාගැනීම අනිත්‍ය සංඥාවයි. අනිත්‍ය සංඥාව වැඩුනුවිට රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ මේ සියල්ල ගැන කළකිරෙනවා අපේ ජීවිතයේ බොහෝ දුක්පීඩා මේ අනිත්‍ය සංඥාව දියුණු කිරීමෙන් නැතිකර දැමිය හැකියි.

සංඥාවේ අනිත්‍යය

දැනුවත්වීමත් සමඟම හඳුනාගැනීමත් හටගන්නවා. එහි ප්‍රධාන හේතුවවන විඤ්ඤාණය නැතිවීයාමෙන් එයද නැතිවී යනවා. අපට හිතෙන්නේ මේ සංඥා නැත්නම් හැඳුනුම්කම් කාලයක් පවතිනවා කියලා නමුත් සැබෑවටම වෙන්නේ විඤ්ඤාණයත් සමඟ හටගත්ත සංඥා ඒ ඒ අවස්ථාවල නැතිවී නැවත නැවතත් එවැනිම ආකාරවූ සංඥාවන් හටගැනීමයි.

හොඳටම වයස්ගත පුද්ගලයෙකුගෙන් ඔහුගේ මිත්‍රයෙක් හෝ හඳුනන කෙනෙක් මාව මතකදැයි ඇහුවොත් "මතක නැහැ" යැයි පිළිතුරු දෙන්නේ කලින් තිබුනු සංඥාව නැතිවූ නිසයි.

මෙසේ වයසට යනවිට පරණ හැඳිනීම් නැතිවෙනවා. වෙන ආකාරයකට කියනවනම් වයසට යනවා කියන්නේ පෙරතිබූ රූප, වේදනා, සංඥා ආදී ධර්මතාවල නැතිවී යාමම තමයි. සමහරවිට පසුගිය භවයේදී නොයෙක් පුද්ගලයන් හඳුනාගෙන, නොයෙක් හැඳුනුම්කම් ඇතිව ඔබ ජීවත්වෙන්නට ඇති. දැන් ඒ පිළිබඳව කිසිම මතකයක් නැහැ. නිදසුනක් ලෙස ගිය භවයේ ඔබ මනුශ්‍යයකුව සිටියෙදී ඇසුරු කළ කෙනෙක්ව ඔබට පෙනෙන්නට සැලැස්සුවහොත් එම පුද්ගලයාව ඔබ හඳුනාගන්න එකක් නැහැ. මෙතනදි ඉස්මතු වන්නේ සංඥාවේ අනිත්‍යතාවයයි.

යෝගාවචරයකුගේ යෝගාවචර දිවියේ ප්‍රධාන කරතව්‍යය වන්නේ විඤ්ඤාණය, සංඥාව වැනි විශේෂිත මානසික ධර්මයන් ගැන මනා අවබෝධයක් ඇතිකරගෙන ඒවා අනිත්‍යාදී ලෙසින් විදර්ශනා කිරීමය. මෙම කෘතියෙන් මෙතෙක් විස්තර වූයේ විඤ්ඤාණය සංඥාව ආදිය එදිනෙදා ජීවිතය තුළින්, එදිනෙදා ව්‍යවහාරය තුළින් අවබෝධ කරගන්නට උපකාර පිණිසය මෙසේ. තමන් හා අන් අය කෙරෙහි ඇති මෙම නාම රූප ධර්මයන් සියල්ල හඳුනාගෙන ධර්මයට ගලපා අනිත්‍යය, දුක්ඛ, අනාත්ම ස්වභාවයෙන් දැකීමෙන් කලාතුරකින් ලැබුණු වාසනාවෙන් ප්‍රයෝජන ගන්නට ඔබ සමත් වෙත්වා! ඔබට වාසනාව ලැබේවා...

....නිමි....